

## හිම්දිරි උදය

ඉර මාමා හෙමින් හෙමින් පායා එනවා
අඳුර මකා හැමතැනටම එළිය බෙදනවා
හිමින් හිමින් පිනි ටිකටික වියැකී යනවා
අපි හැමෝම උදේ රැයින් පාසැල් යනවා

පාන් මාම උදේ රැයින් පාන් බෙදනවා
මල් පිබිදී මුළු ලෝකෙම සුවඳ හමනවා
කුරුළු රැන් ටික ඇතට පියඹා යනවා
මුළු ලෝකෙම ලස්සනදැයි අපිත් බලනවා

කම්මැලියන් වකුටුගැසී නිදන් ඉන්නවා
අප හැමෝම පේලිගැසී පාසැල් යනවා
උදයක අසිරිය බලන්න සැමට කියනවා
හිරු දෙවියන් සැමදා අප සමග සිටිනවා

♦ ***අනුෂා මධුමාලි***
***සෝමාදේවි මහා විද්‍යාලය***
**සෙවනගල Sri Lanka**

## සිරිපා නම් කඳු මුදුනයි

සිරිපා නම් කඳු මුදුන යි
එය පා මුල ගම්මානෙ යි
සුන්දර නාදයයි ඇසෙන් නේ
ඒ සන්ධ්‍යා නාදය වන් නේ

හිම්දිරියේ උදයේ පිපි ඉරේ යා
සිසිල දැනේ මගෙ ගෞතම පිනේ යා
දැක්කම ඉබේටම සාදුයි කිවේ යා
එනම් කන්ද සිරිපා හිම සැදේ යා

♦ ***එන් සඳමාලි වර්ණකුලසූරිය***
***මහින්ද මහා විද්‍යාලය, මඩහපොළ***
**මැල්සිරිපුර Sri Lanka**




**Children's Corner**

## History of the Olympic Games
## ඔලිම්පික් ක්‍රීඩාවේ ඉතිහාසය

The It is believed that organized atheletic contests took place in Greece over 3500 years ago and by the 6th century BC there were four major contests taking place at Olympia, Delphi, Nemea and Corinthi. The Olympic games were started in 776 BC, and were held every four years until the Romans abolished them in 393 AD.

In 1887 the French Baron Pierre de Coubertin began gaining support for the games. His plan was presented in 1894 and the International Olympic Committee founded. In 1896 the first Games took place in Athens. In order to keep the Games free of corruptions, Coubertin felt that the competitions should be amongst amateaurs. This principle remains today.

සංවිධිත ක්‍රීඩා තරඟ වසර 3500 කට පෙර ග්‍රීසියේ තිබුණු බවත්, ක්‍රි. පූ. 6 වන සියවස වනවිට එය ඔලිම්පියා, ඩෙල්පි, නිමියා සහ කොරින්තියා හි පැවැත්වුණු බවත් කියති. ඔලිම්පික් ක්‍රීඩාව ක්‍රි. පූ. 776 දී ඇරඹී වසර හතරකට වරක් පැවත්වුණි. ක්‍රි. ව. 393 දී රෝමන්වරු එය නැවැත්වූහ. 1887 වසරේදී ප්‍රංශ වංශාධිපතියෙකු වූ පියරේද කෝබටින් එය යළිත් අරඹා 1896දී ජාත්‍යන්තර ඔලිම්පික් මණ්ඩලයක් ඇති කළේය.

♦ ***Auntie Ramani (රමණී නැන්දා)***

## පෙන්ගුවින්



පැළඳුවේ නැතිවුනත් ටයිකෝට්
නොදැමුවද කිසි දිනක පාවහන්
නොතිබුණත් අත ලියන මහපොත්
හරිම හොඳ පෙන්ගුවින් කෙනෙක් මං
රෝස පැහැ පය තබාලා
කළුපාට අත් දෙකක් යවාලා
රත් වර්ණ මගෙ හොටය වනලා
ඇවිද යමි ජල තලය සොයලා

♦ ***ප්‍රභාශ්වර චන්ද්‍රපද්ම - නාලන්දා විදුහල***


ලංකා බැංකුව
BANK OF CEYLON

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

***ලන්ඩන් ශාඛාව***

***ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරීමේ මහඟු අවස්ථාවක් !***

✳ ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.

✳ ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. **පවුම් වලින්ම පොළිය ලබාගැනීම.**
2. **ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.**
3. **NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.**

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* **HSBC, NATWEST, BARCLAYS** *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*

**HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624**
**NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732**
**BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859**

**No 1, Devonshire Square, London EC2M 4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit**


## සාදර සිහිකිරීමයි !



## ප්‍රේමා අදිකාරි මහත්මිය

විශ්‍රාම ලත් විදුහල් පතිනියක වන ප්‍රේමා අදිකාරි මහත්මිය අභාවප්‍රාප්තව මේ අගෝස්තු මාසයට වර්ෂයක් සම්පූර්ණ වේ. ඇයගේ ගුණ සිහිකරමින් දූ දරුවෝ ඇතුළු පවුලේ අය හා හිතවතුන් සියල්ලෝ ශ්‍රීලංකවේ ද, ඔවුන් වෙසෙන අන් විදේශ රටවලද දාන මානාදිය සිදුකොට ඒ ආදරණීය මාතාවට පිං පමුණුවන්නාහ.

අදිකාරි මහත්මිය තම උපන් දෙසට, හෙළ බසට, ආගම දහමට, සාහිත්‍යයට හා සිංහළ කවියට එක හා සමාන ආදරයක් දැක්වූ කෙනෙකි. සදහම් ශ්‍රවණයටද භාවනා වටද නිබඳ යොමුවූවාය. ගුරුවරියක වශයෙන් ජීවිතය අරඹා විදුහල් පතිනියක ලෙසද සේවය කරමින් ගෙවුණු දිවි මග පුරා චාම්බව ද, හික්මීම ද, ආදර්ශමත්බව ද නොඅඩුව වීය.

ප්‍රේමා අදිකාරි මහත්මියට සසර කෙළවර උතුම් නිවන් සුව ප්‍රාර්ථනා කරමු !

**Daily News**
**(Opinion Page)**
**Tuesday, July 27, 2010**

## Honesty & discipline of highest calibre

**COLOMBO**: On July 10, Sandya Silva accompanied by my two little grand daughters arrived at the Bandaranaike International Airport by flight EK 651 from London at 2.15 pm. I left the Airport soon with my bag and baggage being loaded to the van.

Only when I arrived at home, I realized that my hand-luggage has been left behind at the Airport, and immediately contacted the Airport authorities, where they directed my call to the Port and Aviation Security Division.

I spoke to one officer called N.P. Sena, and told him I left my hand luggage out side the Airport building in an area where the passengers who have arrived are gathering. The officer Sena told me to come immediately to identify my luggage.

On our arrival at the Airport, I met the three officers N.P. Sena, R.M. Jayawardena and A.M. D.U. Rajakaruna who were very polite and courteous.

I identified my grand children's original educational certificates, their two passports, Sterling Pounds (1,200) US Dollars ($400) and few thousands of Rupees as well.

It was not the cash that I was worried, but the certificates and two passports. I would like to state, not a pin was missing and that would speak for the honesty of every officer employed in the Airport.

මගේ පුංචි මුනුබුරන් දෙදෙනා සමග ලන්ඩනයේ සිට ශ්‍රී ලංකාවට ගිය මම කටුනායකදී බෑග් සියල්ල වෑන් රියකට පටවාගෙන ගෙදර ගියෙමි. ගෙදර ගිය විගස මට සිහිවුණේ ගුවන්තොටුපළේ සෙනග පිරුණු පැත්තක තැබූ මගේ අත්බෑගය ගන්නට අමතක වූ බවය. මම සැනින් ගුවන්තොටුපළට ටෙලිෆෝන් කළෙමි. එක් නිළධාරියෙක් මට ඉක්මනින් එන්නට කීවේය. ගිය විට මට ඉතා විනීතව කතාකළ ඒ නිළධාරීහු මගේ බෑගය පෙන්නා ඒ තුළ ඇති දේ ගැන ඇසූහ. මගේත්, මුනුබුරන්ගේත් පාස්පෝට්, ඔවුන්ගේ පාසැල් සහතික, පවුම් **1200** ක් සහ ඇමරිකානු ඩොලර් **400** ක් ආදිය ඒ බෑගයේ තිබුණු බව මම කීවෙමි. බෑගය ඇරි විට ඒ කී සියල්ල ඒ තුළ කිසිවක් අඩු නැතිව තිබුණි. මම ඒ නිළධාරීන්ට දහස්වර ස්තුති කරමි. අපේ කටුනායක අවංකකමට මෙය හොඳම සාක්ෂිය නොවේද? අවංකකම කාරුණිකභාවය අප රටෙන්, අප ජනතාවගෙන් තවම ගිලිහී ගොස් නැති බව කියන්නට මම මේ ලිපිය ලීවෙමි.

# INTERNATIONAL BUDDHIST RELIEF ORGANISATION

## 10TH ANNIVERSARY OF OUR ADMITTANCE TO THE UNITED NATIONS UNDER SPECIAL STATUS.

**To mark this event we are having a reception at**
**The House of Commons in the British Parliament**
**on October 20th 2010 at 4pm**

***We will have very special guest and a number of other distinguished guests from different part of the world.***

**Ticket is £50 each and there will be a buffet and drinks. We do hope you can come to this event and give a tremendous boost to our charity work. Please let us know by Email or Telephone as soon as possible, then the Official invitation card will come to you from our Member of Parliament, the RT. Hon. Gordon Henderson MP**

**Padmini Nissanga -**
***The Chief International Public Relations Officer to the UN***
**Email: miniibrongoun@gmail.com**
**Telephone: 0121 523 6660**

## උපන්දින සුබපැතුම් !
## Bithday Greetings!



**Happy Birhday to our loving daughter Ashendri who celebrates her 5th birthday on 23 August 2010**

**මෙම අගෝස්තු 23 දින 5 වෙනි උපන්දිනය සමරන නුගේගොඩ අශේන්ද්‍රි දුවට ප්‍රීතිමත් උපන්දිනයකට ආසිරි පතන්නේ අදරැති අම්මා, තාත්තා, සීයා, මාමලා, නැන්දා සහ පුංචි අම්මා ඇතුළු පවුලේ සියළුදෙනා.**